ගුරුවරියක් විසින් සිය ශිෂ්‍යයෙකු අපයෝජනයට ලක් කිරීමේ සිදුවීමක් මාධ්‍ය තුළ වාර්තා වී තිබිණි. එම සිදුවීම හුදු ප්‍රේම සම්බන්ධයක් ලෙසින් හුවා දක්වා තිබූ ලිපිද ඒ අතර දක්නට ලැබිණි. දිවයින (10/18) පුවත්පත තුළ "ටීචර්ගෙන් ගෝලයාට දිවි ඇතිතෙක් දඬුවමක්" යන සිරස්තලයෙන් යුතුව ප්‍රකාශ වී තිබූ ලිපිය ඊට උදාහරණයකි. මෙම ලිපිය නිරීක්ෂණයේදී පාඨක අපට ගැටළුකාරී තැන් කිහිපයක් පෙනී යයි.

1) බාලවයස්කරුවෙකු හා ලිංගික හැසිරීම නීතියට අනුව ලිංගික අපයෝජනයක් සහ දඬුවම් ලැබිය හැකි වරදක් ලෙසින් සැලකේ. එසේ නම්, මෙම සිරස්තලය තුළ එය වරදක් ලෙසින් පෙන්වා දී නොමැත්තේ මන්ද?
සිරස්තල යෙදීමේදී නිර්මාණශීලී වීමේ අයිතිය කිසිසේත්ම ගැටළුවක් නොවන නමුත්, එම නිර්මාණශීලී වීම ඔස්සේ මෙහි ලිංගික අපයෝජනය යන වරද සිදුවී ඇති බවක් නොදැක්වෙන්නේ නම් එය බරපතළ ගැටළුවකි.

2) මෙම ලිපිය ලියැවී ඇති භාවාතිශය, කතාන්තරමය ශෛලිය ඔස්සේද, එම අපයෝජනය හුදු "පෙම් සබඳතාවයක්" බවට ලඝුවී නැතිද?

3) ලිංගික අපයෝජනයක වින්දිතයෙකු වන බාලවයස්කරුවෙකුගේ ඡායාරූප පුවත් වාර්තා ඔස්සේ පළ නොකළ යුතු බව මාධ්‍ය ආචාර ධර්මයන් හි දැක්වේ. ලිපිය සමග බාලවයස්කරුගේ ඡායාරූපය පළ වී ඇති අතර, එහි ඇස් හරහා කළු කොටුවක් ඇඳ ඇත. නමුත් එයින් ප්‍රමාණවත් ලෙසින් බාලවයස්කරුගේ අනන්‍යතාවය සැඟවෙන්නේද යන්න ගැටළුවකි. එසේ නම් මෙසේ බාලවයස්කරුගේ ඡායාරූපය ලිපිය සමග පළ කිරීම අනුමත කළ හැකිද?

මෙම කරුණු සලකා බැලීමේදී, දිවයින ලිපිය ආචාර ධර්මයන් උල්ලංඝනය කරන්නක් යැයි සැලකීමට සිදු නොවේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස් මොනවාද?

**#MediaEthicsSL #lka #SinhalaPress #SundayDivaina**